# ව්‍යාපෘති කාර්ය මණ්ඩල බඳවා ගැනීම

## රූපවාහිනී විකාශන ඩිජිටල්කරන ව්‍යාපෘතිය

## සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

JICA ආයතනය අරමුදල් සපයනු ලබන රූපවාහිනී විකාශන ඩිජිටල්කරන (DTTB) ව්‍යාපෘතියට පහත සඳහන් තනතුරු සඳහා 'කොන්ත්‍රාත් පදනම' මත ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා රාජ්‍ය / පෞද්ගලික අංශයේ සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. සියලුම බඳවා ගැනීම් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ (DMS) චක්‍රලේඛ අංක 01/2019 සහ රජයේ බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිවලට අනුව සිදු කෙරේ. ඉහත සඳහන් චක්‍රලේඛයේ 03 වන වගුවේ 06 තීරුවේ එක් එක් තනතුර සඳහා වැටුප සඳහන් කර ඇත.

අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 54 ට අඩුවිය යුතුය. ඉංග්‍රීසි භාෂාව පිළිබඳව ප්‍රවීණතාවය, රජයේ නීති රීති පිළිබඳ අවබෝධය සහ පරිගණක සාක්ෂරතාවය අත්‍යවශ්‍ය පූර්ව අවශ්‍යතා වේ. ශ්‍රී ලංකාවේ විදේශ අරමුදල් සහිත ව්‍යාපෘතිවල සේවය කර ලබා ඇති සේවා පළපුරුද්ද අමතර සුදුසුකමක් වනු ඇත.

| අනු අංකය | වැටුප් මට්ටම / කාණ්ඩය | තනතුරු | තනතුරු ගණන |
|---|---|---|---|
| 01 | PS 3 | සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඉලෙක්ට්‍රෝනික හා විදුලි සංදේශ ඉංජිනේරු) | 01 |
| 02 | PS 3 | සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ (සිවිල් ඉංජිනේරු) | 01 |
| 03 | PS 3 | සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) | 01 |
| 04 | PS6 | තාක්ෂණික නිලධාරි (ඉලෙක්ට්‍රෝනික හා විදුලි සංදේශ ඉංජිනේරු) | 02 |
| 05 | PS6 | ව්‍යාපෘති නිලධාරි | 03 |
| 06 | සහායක කාර්ය මණ්ඩලය | කළමනාකරණ සේවා නිලධාරි | 02 |
| 07 | | කාර්යාල සහකාර | 01 |
| 08 | | රියදුරු | 02 |

එක් එක් තනතුර සඳහා වැඩිදුර තොරතුරු www.dttb.gov.lk වෙතින් ලබා ගත හැක.

ඉහත අවශ්‍යතා සපුරාලන අයදුම්කරුවන් තම ජීවදත්ත අයදුම්පත සමග ආවරණ ලිපියක්, සුදුසුකම් සහ පළපුරුද්ද සනාථ කරන ලේඛනද සමග 2026 ජනවාරි 16 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපැලෙන් පහත දක්වා ඇති ලිපිනයට එවිය යුතු අතර, ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය. ඉහත ලේඛනවල මෘදු පිටපත් pddttb@media.gov.lk වෙත විද්‍යුත් තැපැලෙන් එවිය යුතුය.

ව්‍යාපෘති අධ්‍යක්ෂ,
රූපවාහිනී විකාශන ඩිජිටල්කරන ව්‍යාපෘතිය,
315 – ඒ, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ඕනෑම ආකාරයකින් බලපෑම් කිරීම නුසුදුසුකමක් වන අතර, එවැනි අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ලේකම්,**
**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.**
**2026.01.02**